# පුංචි නෙසාකිගේ පුංචි හොඳ වැඩේ



එන්.ජී. නෙසාකි යෙහන්සා ඉලංගකෝන්

# පුංචි නෙසාකිගේ
# පුංචි හොඳ වැඩේ

එන්.ජී. නෙසාකි යෙහන්සා ඉලංගකෝන්

**පුංචි නෙසාකිගේ පුංචි හොඳ වැඩේ**

කර්තෘ ප්‍රකාශනයකි

පළවන මුද්‍රණය 2023 ඔක්තෝබර්

කතාව සහ චිත්‍ර

**එන්.ජී. නෙසාකි යෙහන්සා ඉලංගකෝන්**

2 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විදුහල

ISBN 978-624-206-727-8

# <u>පිදුම</u>

මට මුල් අකුරු කියාදුන්

මංජුලා සුමණසිංහ

මාගේ ගුරු මෑණියන් හට හා

මාගේ ආදරණීය දෙමාපියන්ට

මෙම පුංචි පොත පුද කරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට පීවයක් වූ සෙනෙවිරත්න මහලේකම් මහතාගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර,
විදුහල්පතිනිය.
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.
2023 .10 . 20



තාත්තෙකුයි අම්මෙකුයි
දිණියන් දෙදෙනෙකු සමග
පවුලක් සිටියා.

දියණියන් දෙදෙනාගෙන්
ලොකු දුවගේ නම ඉසුම්.
පොඩි දුවගේ නම නෙසාකි.

ඉසුම් දුව නම් හරිම හොඳ අක්කා කෙනෙකි. ඉසුම් නම් දෙමාපියන්ට වගේම හැමෝටම හොඳ ළමයෙකි.

නෙසාකි පොඩි දුව නම් ටිකක් දඟ හුරතල් නංගි බබෙක්.

නෙසාකි දුව අම්මාගෙන් දවසක් මෙහෙම ඇසුවා.

"අම්මා මගේ පන්තියේ නුලාරා කියලා යාළුවෙක් ඉන්නවා.

එයා හැමදාම අපි කෑම කන

වෙලාවට වතුර ටිකක් බීලා

ඔළුව මේසයෙන් තියාගෙන

ඉන්නවා. අපි කෑම කාලා ඉවර

වෙනකම්. ඇයි අම්මේ එයා

එහෙම ඉන්නේ?

"අනේ පව් දුවේ එයා කෑම ගේන්නේ නැතුව ඇති. ඇයි දුව මට මුලින් කිව්වේ නැත්තේ. මම ඔයාට හෙට ඉඳලා කෑම එකක් වැඩිපුර දෙන්නම්. ඔයා යාළුවටත් දීලා කන්න."

අම්මා පුංචි නෙසාකිට කිව්වා.



“හරිම හොඳයි මට හෙට ඉඳන්
මගේ කෑම කන්නේ නැති
යාළුවටත් දීලා කන්නම්”

පුංචි නෙසාකි සතුටින් කිව්වා.

පසුදා කෑම කන වෙලාවට
පන්තියේ යාළුවා වන නුලාරාට
කෑම දුන්නා.



යාළුවා නෙසාකිට ගොඩාක් ස්තුති කරමින් එයා රසට කෑම හැමෝම එක්ක සතුටින් කාලා සෙල්ලම් කළා.

පුංචි නෙසාකි ගෙදර ඇවිත් අම්මාට කිවුවා මට අද හරිම සතුටුයි කියලා.



“එහෙම තමයි දුවේ අපි හැම වෙලාවෙම අපට පුළුවන් විදියට අසරණ නැති බැරි අයට පිහිට වෙන්න ඕනේ. ” අම්මා දුවට ආදරෙන් නළල සිඹිමින් කිව්වා.



“ඔව් අම්මේ මේ වාගේ දේවල් අපේ පන්තියේ ගුරුතුමිත් අපිට කියලා දීලා තියෙනවා කියලා” පොඩි දුව අම්මාගේ අතේ එල්ලී කිව්වා.

“හොඳ දේවල් අපි හැම වෙලේම ඉගෙන ගන්න ඕනේ දුවේ.”

එතකොට තමයි අපිට ජීවිතේ හොඳ දේවල් ලැබෙන්නෙ කියා අම්මා පුංචි නෙසාකිට කිව්වා.

"තාත්තේ මමත් දැන් අක්කි වාගේ හොඳ ළමයෙක් නේද?".



“ඔව් මගේ දුවලා දෙන්නාම හරිම හොඳයි” කියා තාත්තා සහ අම්මා ලොකු දියණියගෙත් පොඩි දියණියගෙත් නළල සිප ගත්තා.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20